සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province Department of Education - Western Province

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ....................................................................................... විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

*** I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**

*** II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**

---

## I පත්‍රය

❖ **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) වායුගෝලයේ මුළු වායු ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් අඩංගු වන්නේ,

(1) ඔක්සිජන් වායුවයි. (2) නයිට්‍රජන් වායුවයි.

(3) කාබන්ඩයොක්සයිඩ් වායුවයි. (4) මීතේන් වායුවයි.

(02) ආසියානු ප්‍රදේශයේ දක්නට ලැබෙන ගංගා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) යැංසිකියැං, ඇමසන්, හොවැංහෝ (2) සින්ධු, හොවැංහෝ, යැංසිකියැං

(3) හොවැංහෝ, යැංසිකියැං, නයිල් (4) මරේඩාලිං, ඇමසන්, කොංගෝ

(03) අරාබිය, ඉරාකය, ඉරානය, තුර්කිය අයත් වන්නේ,

(1) මධ්‍යම ආසියාවට ය. (2) උතුරු ආසියාවට ය.

(3) නිරිතදිග ආසියාවට ය. (4) නැගෙනහිර ආසියාවට ය.

(04) ඇළදොළ දිගේ පළිඟු කැට මෙන් දිදුලමින් ගලා බසින ජලය නිකම්ම දිය දහරක් නොව ඒ අපේ මුතුන් මිත්තන්ගේ රුධිරයයි. මෙසේ ප්‍රකාශ කළේ,

(1) රතු ඉන්දියානු නායක සියැටල් විසිනි. (2) මහත්මා ගාන්ධිතුමා විසිනි.

(3) බුදුන් වහන්සේ විසිනි. (4) අබුබකර් (රලි) පළමු කලීෂාතුමා ය.

(05) කන්ද පාමුල දී සමෝච්ච රේඛා ඈතින් ද, කන්ද මුදුනේ දී ළංව ද අඳිනු ලබන භූ ලක්ෂණය හඳුන්වනු ලබන්නේ,

(1) මෙහොර බෑවුම නමිනි. (2) උත්තල බෑවුම නමිනි.

(3) අවතල බෑවුම නමිනි. (4) කපොල්ල නමිනි.

❖ **අංක 06 - 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

(06) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ලෝකඩ, රිදී හා මැටිවලින් කර්මාන්ත තිබූ බවට සාධක ඇත. (නි / වැ)

(07) කොළඹ පුරවරයට ගම්පහ, කොළඹ, අවිස්සාවේල්ල දිස්ත්‍රික්ක අයත් වේ. (නි / වැ)

(08) ස්වභාවික ආපදාවලට මුහුණ දීම සඳහා දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වේ. (නි / වැ)

(09) තාක්ෂණික දියුණුව නිසා මිනිසා පරිසරය අධික ලෙස ප්‍රයෝජනයට ගනී. (නි /වැ)

(10) සිතියම්ගත ප්‍රදේශයේ දිග හා පළල මැන ගැනීමෙන් එම භූමියේ විශාලත්වය ගණනය කළ හැකි ය. (නි / වැ)

❖ **අංක 11 - 15 දක්වා වගන්තිවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(හේන්, මුතුරාජවෙල, ටිබෙට්, ඉලිප්සාකාර, ත්‍රිකුණාමලය. වී, ඉරාන)

(11) නිල් ග්‍රහයා සූර්යයා වටා ............................................ මාර්ගයක පරිභ්‍රමණය වේ.

(12) ........................................... ලෝකයේ ඇති විශාල ම සානුවකි.

(13) සල ගොවිතැන ශ්‍රී ලංකාවේ දී ........................................... ගොවිතැන යනුවෙන් හැඳින්වේ.

(14) ජෛව විවිධත්වයෙන් ඉහළ ........................................... ශ්‍රී ලංකාවේ වටිනා තෙත් බිමකි.

(15) ආසියානු කලාපයේ ඉතා ම වැදගත් ස්වභාවික වරාය වූ ............................... වරාය ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටා ඇත.

❖ **අංක 16 - 20 දක්වා "අ" තීරුව හා ගැළපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා යා කරන්න.**

| (අ) | | (ආ) |
|---|---|---|
| (16) රැම්සා සම්මුතිය | A. | CFC හා හෙලෝන් වායුව වායුගෝලයට එක්වීම වළකයි. |
| (17) හිරු දෙවියා | B. | ඊජිප්තු වැසියන් වන්දනා කරන ඔරිසිස් |
| (18) බිම්ස්ටෙක් සංවිධානය | C. | තෙත් බිම් සංරක්ෂණය කරයි. |
| (19) රියෝ සම්මුතිය | D. | ඊජිප්තු වැසියන් වඳින හතෝර් |
| (20) ගස්වැල්වලට අධිපති දෙවියා | E. | ඊජිප්තු වැසියන් වඳින ආටේන් |
| | F. | බෙංගාල බොක්ක කලාපීය සංවිධානයයි. |

(ලකුණු 2 x 20 = 40

## II පත්‍රය

*** පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

*** අනිකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

*** පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) "බිත්ති පුවත් පතක් සැකසීම" ක්‍රියාකාරකම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) බිත්ති පුවත්පත සකස් කිරීමට පෙළපොතින් නියමකර තිබෙන පාඩම කුමක් ද? (ලකුණු 01)

(ii) ක්‍රියාකාරකම සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) ක්‍රියාකාරකමට තොරතුරු ලබාගත් වෙනත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමෙන් ලැබුණු වාසි තුනක් ලියන්න. (ලකුණු 03)

(v) ක්‍රියාකාරකම සිදු කිරීමේ දී පැනනැගුණු ගැටළු දෙකක් ද,
එය නිරාකරණය කරගැනීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් ද ලියන්න. (ලකුණු 04)

(vi) ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ඔබට ලැබූ වාසි දෙකක් ද එම වාසි ඉගෙනුම් ඉගැන්වීම්
ක්‍රියාවලියට ප්‍රයෝජනවත් වන ආකාර දෙකක් ද ලියන්න. (ලකුණු 04)

(02) (i) නිල් ග්‍රහයාගේ සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) නිල් ග්‍රහයාගේ වායුගෝලයේ ප්‍රධාන ස්තර හතර නම් කරන්න. (ලකුණු 04)

(iii) (a) ජලය දූෂණයට බලපාන ප්‍රධාන හේතු තුනක් ලියන්න.

(b) ජලය හිඟවීම නිසා ඇතිවන ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 05)

(03) (i) ආසියානු කලාපයේ ජනතාවට මුහුණපෑමට සිදුවන ස්වභාවික ආපදා දෙකක්
ලියන්න. (ලකුණු 02)

(ii) ඔබ සඳහන් කළ ආපදා නිසා මතුවී ඇති ගැටලු හතරක් ලියන්න. (ලකුණු 04)


(iii) (a) ආසියානු කලාපයේ මානුෂික හා භෞතික අභියෝග අවම කර ගැනීමට
පිහිටුවා ගෙන ඇති සංවිධාන තුනක් ලියන්න.

(b) ඉන් එක් සංවිධානයක අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 05)

(04) (i) ආසියාවේ ඉතා ඉහළ දියුණුවක් ලැබූ කාර්මික ක්ෂේත්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ආසියානු කලාපයේ කාර්මික දියුණුවට අවතීර්ණ වූ නව කාර්මික රටවල්
හතරක් සිතියමේ A, B, C, D වශයෙන් දක්වා ඇත. ඒවා පිළිවෙළින් නම් කරන්න.
(ලකුණු 04)


(iii) ඉහත රටවල් වේගවත් කාර්මික දියුණුවක්
ළඟා කරගැනීමට බලපෑ හේතු දෙකක්
කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)



(05) (i) සපයා ඇති සිතියම් කොටස ඇසුරින් උතුරු ප්‍රදේශයට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) උතුරු ප්‍රදේශයට ආවේනික ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) උතුරු ප්‍රදේශයේ මානුෂ කටයුතු පිළිබඳ කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)





(06) (i) රටක සංවර්ධනය වේගවත් කිරීමේ දී පරිසරයට සිදුවන අහිතකර බලපෑම සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. එවැනි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා ඇති වන පාරිසරික ගැටලු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පරිසර තුලිතතාවය ආරක්ෂා කිරීමට ගත හැකි පොදු ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) මෙහි අංක 01 හා 02 න් පෙන්නුම් කරන භූ ලක්ෂණ හඳුනාගෙන පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙහි ප්‍රධාන මාර්ගය හා අප්‍රධාන මාර්ගය එක්වන ස්ථානය මංසන්ධි ජනාවාසයකි. එම මංසන්ධියේ ඇති පොලීසිය, රෝහල, පාසල, උප තැපැල් කාර්යාලය ඔබේ පිළිතුරු පත්‍රයේ සම්මත ලකුණු හා වර්ණවලින් ඇඳ දක්වන්න. (ලකුණු 04)




(iii) (a) A ශ්‍රේණියේ ප්‍රධාන මාර්ගය සම්මත වර්ණයෙන් ඇඳ දක්වන්න. (ලකුණු 02)

(b) 1 : 50000 සිතියමට සුදුසු රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ලකුණු 03)